**16-09-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පරමාත්ම පියා සිහි කිරීමෙන් හා සැළකිලිමත්ව සිටිමින් එකිනෙකාට සංඥා කිරීමෙන් ඔබ එකිනෙකා අතර දියුණුව ඇති කර ගන්න.

**ප්‍රශ්නය:** පරම පියා මෙන්ම ඥානයෙන් පිරෙන දරුවන්ගේ ජීවිත තුළ ධාරණය වී තිබෙන ප්‍රධානම දේ කුමක්ද?

**පිළිතුර:** ඔවුන් දිගින් දිගටම සිනහමුසු මුහුණින් සිටින අතර, කිසිම අවස්ථාවකදී අඬන්නේ නැත. සිදුවන කිසිම දෙයක් අළුත් දෙයක් නොවෙයි. මේ ආකාරයෙන් දැන් ඥානයෙන් පිරෙන අය, එනම්, අඬන්නේ නැති අය කිසිම අවස්ථාවකදී තම සාමය නැති කර ගන්නේ නැත. දිව්‍යලෝකයේ අධිකාරීත්වය ලබන්නෝ ඔවුන්ය. අඬනා අය සෑම දෙයක්ම නැති කර ගන්නා අතර තම තත්ත්වයත් නැති කර ගන්නවා ඇත.

**ගීතය:** ඔබව සොයා ගැනීමෙන් මම මුළු ලෝකයම සොයා ගත්තෙමි. අහසත් පොළොවත් සියල්ල මා හට අයිතිය.

ඕම් ශාන්ති. සුමිහිරි දරුවන්ට තමා විසින් ගායනා කරන ගීතය ඇසුණා. ඔබේ අසීමිත පියා ඉදිරියේ අසුන් ගෙන සිටිනා බව දරුවන් දන්නා අතර ඔබ කියනවා: බාබා, අප නැවතත් ඔබගෙන් ලබා ගන්නා වූ ලෝක අධිකාරීත්වය ලබා ගන්නවා. ස්වර්ණම යුගයේදී ඔබ මෙය ගායනා කරන්නේ නැහැ. මෙම ගීතය ඔබට ගායනා කළ හැක්කේ සංගම් යුගයේදී පමණයි. නිවසේ හෝ කාර්යාලයේ සිටිනා අතරම ඔබ දන්නවා ඔබ නැවතත් ඒ අසීමිත වූ පියාගෙන් අසීමිත උරුමය ලබනා බව. මධ්‍යස්ථාන වල පවා පරම පියාව සිහිපත් කිරීමටත්, ඔබ ලෝක පාලකයන් බවට පත්වනවා යන්න සිහිපත් කිරීමත් ගැන ඔබ අනතුරු අඟවනවා. මෙය අළුත් දෙයක් නොවෙයි. සෑම චක්‍රයකදීම අප, පියාගෙන් ලෝක අධිකාරීත්වය ලබා ගත්තා. අළුත් කෙනෙක් මෙයට සවන් දුනහොත් ඔහු සිතයි, ඔබ මොහුට (බ්‍රහ්මාට) ශිවා ලෙස අමතනවාය කියා. ඔහු තමයි අශාරීරික ජීවාත්මයන්ගේ පියා. ජීවාත්මය අශාරීරික වන අතර පරමාත්ම පියා, උත්තරීතර ජීවාත්මයත් අශාරීරිකයි. ජීවාත්මය අශාරීරික ලෙස හඳුන්වන්නේද එය භෞතික ස්වරූපයක් ලබා නොගන්නා තෙක් පමණි. ඔබේ අසීමිත පියා මාර්ගයෙන් මෙම ඥානයට සවන් දෙන බව දරුවන් දන්නවා. ඒ ආධ්‍යාත්මික ගුරුවරයා ඔබට උගන්වන නිසා ඔබට එකිනෙකා හා අනතුරු අඟවා ගත හැකියි. ප්‍රථමයෙන්ම ඔබ ආධ්‍යාත්මික අනතුරු ඇඟවීම ලබනවා. ඔබ සියලුදෙනාම ඒ අසීමිත පියාගේ ස්මරණයෙහි යෙදී මෙසේ එකිනෙකාට සංඥා කරනවා පරමාත්ම පියාගේ ස්මරණයේ යෙදී ඔබගේ බුද්ධිය වෙන කිසිම තැනක දුවන්නට ඉඩ නොදෙන්න. මේ නිසා තමයි කියන්නේ ජීවාත්ම අවධානයට පත්වී පරමාත්ම පියාව සිහිපත් කරන්න. එය ඉතාමත් පහසු ක්‍රමයක්. 'මන්මනභව්' යන කියමනත් තිබෙනවා. නමුත් එය ඔවුන් තේරුම් ගතහොත් පමණයි. මේ ස්මරණයේ වන්දනා ගමන ඔබට උගන්වන්නේ ඒ එකම පරමාත්ම පියා පමණයි. ඔබ ස්මරණය වන්දනා ගමනේ යෙදෙන බව දන්නේ දරුවන් වන ඔබ පමණයි. ඒ වන්දනා ගමන භෞතික වන්දනා ගමනක්. නමුත් ඔබ තව දුරටත් භෞතික වන්දනාකරුවන් නොවෙයි. ඔබ ආධ්‍යාත්මික වන්දනාකරුවන් බවට පත්වනවා. පාප පරාජය කළ අය බවට පත්වීමට ඔබට වෙන කිසිම මාර්ගයක් නැහැ. එක කාල පරිච්ඡේදයක් තමයි පාප ජයග්‍රහණය කළ හැකි කාලය. අනික පාප ක්‍රියා කරන්නන්ගේ කාල පරිච්ඡේදයයි. එම කාල පරිච්ඡේදයේදී තමයි පාප ක්‍රියා කිරීම ඇරඹෙන්නේ. රාවණ් රාජ්‍යය ආරම්භ වූ විගසම තමයි පාපයන් ඇරඹෙන්නේ. ඔබ දැන් පාප පරාජය කළ අය බවට පත් වීමට උත්සාහ කරනවා. එහිදී රාවණ් නොසිටින නිසා කිසිම පාපකාරී ක්‍රියාවක් සිදුවන්නේ නැහැ. ලෝකයේ කිසිම කෙනෙක් මෙය දන්නේ නැහැ. ඔබ දැන් පියාගෙන් සියලුම දේ දැන ගැනීමට පටන් ගන්නවා. ඥානයෙන් පිරි තැනැත්තා ලෙස හඳුන්වන්නේ පරම පියා පමණයි. ඒ වගේම ඔහු ඥානය දෙන්නේ දරුවන් වන ඔබට පමණයි. පරමාත්ම දෙවියන්ගේ, එනම්, පරමාත්ම පියාගේ නමත් තිබිය යුතුයි. ඔහුට නමක් හෝ ස්වරූපයක් නැහැයි කියා දෙයක් නැහැ. මිනිස්සු ඔහුව වන්දනා කරනවා. ඒ වගේම, ඔහුගේ නම තමයි ශිවා, පාරිශුද්ධකරු. ඥාන සාගරය වන්නේ ද ඔහුම පමණයි. සාමයේ හා සතුටේ සාගරය වන්නේ ඔහුයි. පියා අනිවාර්යෙන්ම තම දරුවන්ට උරුමයක් දෙනවා. මෙහි ආ ගිය අය වෙනුවෙන් ඔවුන් සිහිවටන නිර්මාණය කරනවා. කීර්තියට පත් වූයේත්, වන්දනීයත්වයට ලක් වූයේත් ශිව බාබා පමණයි. ඔහු අනිවාර්යෙන්ම ශරීරයක් මාර්ගයෙන් ක්‍රියා කරනවා, මේ නිසා තමයි ඔහුව සිහිපත් වන්නේ. ඔහු සදා පවිත්‍රයි. පරමාත්ම පියා

කිසිම විටෙක වන්දනාකරුවෙක් වන්නේ නැහැ, ඔහු සැම විටම වන්දනීයත්වයට සුදුසුයි. පරම පියා කියනවා මා කිසිම විටෙක වන්දනාකරුවෙක් බවට පත්වන්නේ නැහැ, මම වන්දනා ලබනවා. වන්දනාකරුවන් මට වන්දනා කරනවා. ස්වර්ණමය යුගයේදී ඔවුන් මට වන්දනා කරන්නේ නැහැ. ඔබ මාව, පාරිශුද්ධකරු වන පියාව සිහිපත් කරන්නේ භක්ති මාර්ගයේදී පමණයි. මුලදී ඔහුට කරන අව්‍යභිචාරී වන්දනාව තිබුණා. පසුව එම වන්දනාවත් ව්‍යභිචාරී තත්ත්වයට පත් වූවා. ශිව බාබා බ්‍රහ්මා හා සරස්වතීවත් ලෝක පාලකයන් බවට පත් කළා. භක්තිය බොහෝ සෙයින් ව්‍යාප්ත වී තිබෙනවා. බීජයෙහි කිසිම ව්‍යාප්ත වීමක් සිදුවන්නේ නැහැ. පරම පියා කියනවා මා සිහිපත් කර ඔබගේ උරුමය සිහිපත් කරන්න. එච්චරයි. මෙම වෘක්ෂයෙහි වර්ධනය සිදු වනවා සේම භක්තියෙහිත් විශාල වර්ධනයක් තිබෙනවා. ඥානය තමයි බීජය. ඔබ ඥානය ලබනා විට විමුක්තිය ලබනවා. කිසිම දෙයක් පිළිබඳව ඔබ ඔබගේ හිසට පහර දී ගත යුතු වන්නේ නැහැ. ඥානය හා භක්තිය තිබෙනවා. භක්තියෙහි වෘක්ෂය ස්වර්ණමය යුගයේදී හා රිදී යුගයේදී ස්ථාපනය වන්නේ නැහැ. භක්තියේ වෘක්ෂය චක්‍ර භාගයක් පුරා වර්ධනය වනවා. සෑම ආගමකම තම ක්‍රම සහ විධි තිබෙනවා. භක්ති මාර්ගය බොහෝ ව්‍යාප්ත වූවක්! ඥානය සෑම කෙනෙකුටම එකයි 'මන්මනභව්' එච්චරයි! පරමාත්ම පියා, ඇල්ෆා සිහිපත් කරන්න. ඔබ පියාව සිහි කරනා විට අනිවාර්යෙන්ම ඔබගේ උරුමයත් සිහි කරනවා. උරුමය පිළිබඳවත් ව්‍යාප්ත වීමක් තිබෙනවා. එම දේපළ සීමිත වූවක්. මෙහිදී, ඔබ ඔබගේ අසීමිත වූ දේපළ සිහිපත් කරනවා. භාරතයේ මිනිසුන් වන ඔබට ඒ අසීමිත වූ පියා පැමිණ අසීමිත වූ උරුමයක් ලබා දෙනවා. ඔහුගේ උපත සිහිපත් වන්නේ මෙහිදීයි. මෙය සදාකාලිකවම නාටකය තුළ ඒ ආකාරයෙන්ම තීරණය වී තිබෙනවා. පරමාත්ම දෙවියන් උසස්ම වූ තැනැත්තා වන්නා සේම, භාරත දේශයත් උසස්ම ස්ථානයයි. පරම පියා පැමිණ මුළු ලෝකයටම විමුක්තිය ලබාදෙන ස්ථානය එයයි. එමනිසා, එය තමයි සෑම තැනකටම වඩා උසස්ම වූ පූජනීය ස්ථානය. ඔබ කියනවා අහෝ දෙවියනි, පියාණනි, අපව නිවස වෙත ගෙන යන්න! සෑම කෙනෙක්ම භාරතයට ආදරෙයි. පියාත් භාරතයට එනවා. ඔබත් දැන් උත්සාහ දරණවා. ගෝපි වල්ලභයන්ගේ ගෝප් සහ ගෝපීන් වන්නේ ඔබයි. ස්වර්ණමය යුගයේදී ගෝප් හා ගෝපීන් ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. එහිදී, රාජ්‍යය ක්‍රමානුකූලව දිගින් දිගටම සිදුවනවා. ක්‍රිෂ්ණාගේ දිව්‍යමය ක්‍රියාවන් නැහැ, නමුත් එකම පරම පියාගේ දිව්‍යමය ක්‍රියාවන් තිබෙනවා. ඔහුගේ දිව්‍යමය ක්‍රියාවන් ඉතාමත් උසස්! ඔහු මුළු අපිරිසිදු ලෝකයම පිරිසිදු කරනවා. එය ඔහුගේ දක්ෂතාවයයි! මේ කාලයේදී සෑම මනුෂ්‍යයෙක්ම අජාමිල් වැනියි. මිනිස්සු පූජකවරුන් ආදිය උසස් යැයි කියා විශ්වාස කරනවා. පියා කියනවා මම ඔවුන්වත් ඉහළ නැංවිය යුතුයි. ඔබ නළුවන් වනවා සේ පරම පියාත් නළුවෙක්. ඔබ උපත් 84ක් ගෙන ඔබගේ චරිත කොටස් රඟදක්වනවා. ඔහු නිර්මාණකරුයි, අධ්‍යක්ෂකවරයායි, ප්‍රධාන නළුවායි. ඔහු කරන්කරවන්හාර්ය. ඔහු කරන්නේ මොනවාද? ඔහු අපවිත්‍ර වූවන් පාරිශුද්ධ කරවනවා. පරම පියා කියනවා පැමිණ අපව පාරිශුද්ධියට පත්කරන්න කියා ඔබ මට කතා කළා. මමත් මෙම කොටසට යටයි. මෙම නාටකය නිර්මාණය වී තිබෙන්නේ මන්ද, එය නිර්මාණය වූයේ කවදාද යන්න ගැන කිසිම කෙනෙකුට අහන්න බැහැ. මෙම නාටකය සදාකාලිකවම ඒ අයුරින් කැරකෙනවා. එයට ආරම්භයක්, මැදක් හෝ අවසානයක් නැහැ. මෙහිදී සමූලඝාතනයක් සිදුවන්නේ නැහැ. ජීවාත්ම අවිනාශීයි. ඒ වගේම කිසිම විටෙක විනාශ කළ නොහැකියි. ඔවුන් අවිනාශී වූ චරිත කොටසක් ලබා තිබෙනවා. මෙම නාටකය අසීමිතයි. මෙහි අසුන් ගෙන මෙම නාටකයේ කොටස නැවත නැවතත් කැරකෙන්නේ කෙසේද යන්න ගැන සාරාංශගත ලෙස ඔබට විස්තර කර දෙනවා. ඔහු දෙවියන් වන නිසා, මැරුණු මනුෂ්‍යයෙකුට නැවතත් පණ දීමට පුළුවන් කියා දෙයක් නැහැ. මෙහි අන්ධ විශ්වාසයක් හෝ සෘද්ධි බල කිසිවක් නැහැ. ඔබ මට කතා කළා අහෝ පාරිශුද්ධකරුවාණනි එන්න! අපව අපිරිසිදු බවින් මුදවා පාරිශුද්ධත්වයට පත්කරන්න! ඉතින් ඔහු අනිවාර්යෙන්ම එනවා. ගීතාව තමයි සෑම ආගමික ග්‍රන්ථයකම මැණික ලෙස හඳුන්වන්නේ. ගීතාව කිව්වේ පරමාත්ම දෙවියන් විසිනි. හොඳයි, ඔහු මෙම පහසු රාජයෝගාව ඉගැන්වූයේ කවදාද? මෙය දන්නේ ඔබ පමණයි. පරමාත්ම පියා තමා විසින් පාරිශුද්ධත්වයේ ලෝකය නම් වූ පිරිසිදු ලෝකය ස්ථාපනය කරනා විට මෙම චක්‍රයේ සංගම් යුගයේදී මෙහි එනවා. ස්වර්ණමය යුගයේදී ඔහු එය ස්ථාපනය කරන්නේ නැහැ. එය පාරිශුද්ධත්වයේ ලෝකයයි. මෙම උසස් හමුව (කුම්භමේලාව) සිදුවන්නේ සංගම් යුගයේදී පමණයි. එම කුම්භමේලාව සෑම අවුරුදු 12ටම පසුව සිදුවනවා. මෙම උසස්ම වූ කුම්භමේලාව සිදුවන්නේ අවුරුදු 5000ට පසුවයි. මෙය තමයි ජීවාත්මය හා උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මය සෑම ජීවාත්මයක්ම පාරිශුද්ධත්වයට පත්කර ඔහුත් සමඟ ගෙදර රැගෙන යන හමුවීම. ඔවුන්, මෙම චක්‍රයෙහි කාලපරිච්ඡේදය දීර්ඝ කර තිබෙන නිසා මිනිස්සු පටලැවිල්ලට පත්ව තිබෙනවා. ඔබ දැන් සෑම දෙයක්ම තේරුම් ගන්නවා. ඔබ හැර වෙන කිසිම කෙනෙක්ට ඔබ විසින් මුද්‍රණය කර ඇති සඟරා තේරුම් ගන්න බැහැ. පියා කිව්වා දැන් සිදුවන සෑම දෙයක්ම මීට අවුරුදු 5000ට ප්‍රථමත් සිදු වූවා කියා පමණක් ලියන්න. කිසිම අළුත් දෙයක් නැහැ. මීට අවුරුදු 5000ට

ප්‍රථම සිදු වූ හැම දෙයක්ම දැන් නැවතත් සිදු වනවා. මෙය තේරුම් ගැනීමට අවශ්‍ය ඕනෑම කෙනෙකුට මෙහි පැමිණ තේරුම් ගත හැකියි. ඔබ එවන් වූ ක්‍රම නිර්මාණය කළ යුතුයි. පත්තර වල අප පල කළ යුත්තේ මොනවාද? ඔබට මෙසේ ලිවිය හැකියි ඔබ මීට පෙර චක්‍රයේදී කළාක් මෙන්ම මහා භාරත යුද්ධය මඟින් පාරිශුද්ධත්වයේ ලෝකයට දොරවල් විවෘත වන්නේ කෙසේද යන්න ගැන මෙහි පැමිණ තේරුම් ගන්න. මහා භාරත යුද්ධය මඟින් ඒ ස්වර්ණමය යුගය ස්ථාපනය වන්නේ කෙසේද යන්න ගැන වටහා ගන්න. දැන් දේවතාවන්ගේ රාජ්‍යය ස්ථාපනය වනවා. ඔබට පරමාත්ම දෙවියන්ගෙන්, පරමාත්ම පියාගෙන් ඔබගේ ජන්ම උරුමය ලබා ගැනීමට අවශ්‍ය නම් මෙහි පැමිණ එය ලබා ගන්න. මේ ආකාරයෙන් ඔබ ඥාන සාගරය ආවර්ජනය කළ යුතුයි. ඒ මිනිස්සු ලියන කතාත් නාටකයේ ඒ අයුරින්ම තීරණය වූවකි. ඔවුන් නොකඩවාම ඔවුන්ගේ චරිත කොටස රඟපානවා නාටක සැළැස්මට අනුව. ව්‍යාස් ආගමික ග්‍රන්ථ නිර්මාණය කළා. ඔහු එවන් වූ චරිත කොටසක් ලබා ගත්තා. ඔබ දැන් නාටකය තේරුම් ගෙන තිබෙන අතර එම නාටකයම නැවතත් ඒ අයුරින්ම සිදු වනවා. ඔබ දැන් නැවතත් පැමිණ සිටින අතර, මෙම ඥානයට සවන් දෙනවා. ලක්ෂ්මී නාරායනගේ රාජ්‍යය නැවතත් ස්ථාපනය වන බවත් අනෙක් සියලුම ආගම් විනාශ වන බවත් ඔබ දන්නවා. ඔබ දැන් ඥානයෙන් පිරි අය බවට පත් වෙනවා. බාබා ඔබව ඥානයෙන් පිරි, ඔහු හා සම තත්ත්වයට පත් කරවනවා. චක්‍ර භාගයක් පුරාම ඔබ සාමකාමීව සිටින බවත් කිසිම ආකාරයක අසමගියක් එහි නොමැති බවත් ඔබ දන්නවා. එහි සිටින දරුවන් අඬන්නේ නැහැ. ඔවුන් නිරන්තරයෙන් සිනහමුසු මුහුණින් ඉන්නේ. මෙහිදී ඔබ නොහැඬිය යුතුයි. ඔබගේ මව මිය ගියා වුවත් ඔබ හල්වා කෑ යුතුයි කියා දෙයක් තිබෙනවා. අඬන අය සියලු දේ නැති කරගන්නා අතර ඔවුන්ගේ තත්ත්වයත් වෙනස් කර ගන්නවා. ඔබ දිව්‍ය ලෝකයේ අධිකාරීත්වය ඔබට ලබා දෙන ඒ, සියලුම ස්වාමිපුරුෂයන්ගේ ස්වාමිපුරුෂයා හමු වී තිබෙනවා. ඔහු කිසිම විටෙක මිය යන්නේ නැහැ. එමනිසා, ඔබ හඬන්නේ කුමක් නිසාද? නොහඬනා අය අධිකාරීත්වය ලබා ගන්නා අතර අනෙක් අය සෑම කෙනෙක්ම සේවකයන් බවට පත්වෙනවා. ඔබ කවුරු හෝ බාබාගෙන් ඇසුවොත් මේ වගේ තත්ත්වයක මා කවුරු වේද කියා, බාබා ඔබට කියයි. මේ සෑම දර්ශනයක්ම දරුවන් අවසානයේදී දකිනවා. අවසානයේදී, පාසලක සෑම කෙනෙක්ම තම ප්‍රතිඵල දැන ගන්නාක් සේම මේ නිර්මාණය වී ඇති රුද්‍රාගේ මල් දාමය කුමක්ද යන්න ඔබ තේරුම් ගන්නවා. ශිෂ්‍යයෝ විභාගය ලංවන විට හොඳින් පාඩම් කරනවා. මන්ද, ඔවුන් දන්නවා නැතිනම් මේ විෂය මම අසමත් වීමට යනවා කියා. ඔබත් මේ සියලු දේ දැන ගන්නවා. බොහෝ දෙනා කියනවා, තමන්ට තමන්ගේ දරුවා කෙරෙහි බැඳීම තිබෙනවා කියා. එය ඉවත් කළ යුතුයි. ඔබ බැඳී සිටියොත් ඒ එකම කෙනෙක්ට පමණයි. එමනිසා, භාරකරුවෙක් ලෙස ඔවුන්ව රැකබලා ගන්න. ඔබ තුළ ඔවුන් කෙරෙහි ඇති බැඳීම අත්හරින්න. පියාම පැමිණ ඔබට කියනවා ඔබ තුළ ඔවුන් වෙත ඇති බැඳීම අත්හැර දමන්න කියා. සෑම දෙයක්ම අයත් වන්නේ ඔහුට බව සලකා ඔහුගේ උපදෙස් අනුගමනය කරන්න. ඔහුගේ කාර්යයේ නිරත වන්න. නොකඩවාම ඔහුගේ අවිනාශී වූ ඥාන මිණි මුතු බෙදා හරින්න. මෙහිදී පියාගේ උපරිම ගෞරවය තිබෙන්නේ කුමාරීන්ටයි. කුමාරි කෙනෙක් තම භෞතික පියාගෙන් ලබන උරුමයක් නැහැ. මෙහිදී පරම පියා ස්ත්‍රී පුරුෂ කියා වෙනසක් කරන්නේ නැහැ. පරමාත්ම පියා මෙහි අසුන්ගෙන ජීවාත්මයන්ට විස්තර කරනවා. ඔබ සෑම කෙනෙක්ම සහෝදරයන් බවත්, ඔබ පියාගෙන් ඔබගේ උරුමය ලබනා බවත් දන්නවා. ජීවාත්ම වන ඔබ ඉගෙනගෙන පියාගෙන් උරුමයක් ලබනවා. ඔබ උරුමය ලබනා තරමටම ඔබ ලබනා තත්ත්වයත් උසස් වනවා. බාබා පැමිණ ඔබට සෑම දෙයක්ම විස්තර කරනවා. ශිව බාබා අශාරීරික වන අතර ඔහු වන්දනීයත්වයට ද ලක් වනවා. සෝමනාථ දේවාලය තැනුනේ ඔහුටයි. ශිව බාබා පැමිණ කළේ මොනවාදැයි ඔබ දැන් දන්නවා. ඔහුගේ මතකයෙන් දේවාලයක් තැනුනේ ඇයි? ඔබට දැන් මෙය වැටහෙනවා. සෑම චක්‍රයකදීම සිදුවන්නේත් මෙයයි. නාටකයේ තීරණය වී ඇති සෑම දෙයක්ම නැවතත් ඒ ආකාරයෙන්ම සිදු වනවා. පරම පියා අනිවාර්යෙන්ම පැමිණිය යුතු අතර පැරණි ලෝකය විනාශ වී යා යුතුමයි. මේ ගැන පසුතැවිලි වීමක් අවශ්‍ය වන්නේ නැහැ. මේ සෑම දෙයක්ම කාරණයක් නැතිව ලේ හැලීමකි. කිසිම හේතුවක් නැතිව සෑම කෙනෙක්ම මරා දැමෙනවා. එසේ නැතිනම් කෙනෙක් තවත් කෙනෙක්ව මරා දැමුවහොත් එයට වග කියන්නේ කවුද? ස්වභාවික ව්‍යසන අනිවාර්යෙන්ම විය යුතු අතර විනාශය සිදු විය යුතුමයි. කිසිම කෙනෙක් අමරණීය දේශයේ හෝ මරණීය දේශයෙහි අර්ථය වටහා ගන්නේ නැහැ. ඔබ දන්නවා ඔබ සිටින්නේ මරණයේ දේශය තුළ බවත්, හෙට අමරණීයත්වයේ දේශය වෙත යන බවත්. ඒ නිසා තමයි ඔබ මේ ඉගෙන ගන්නේ. මිනිස්සු දැන් ඉන්නේ සම්පූර්ණ අඳුරේයි. ඔබ ඔවුන්ට බීමට ඥාන අමෘතය දෙනවා. ඔබ, කියන සෑම දෙයක්ම ඔළුව වනා පිළිගෙන පසුව නැවතත් නින්දට යනවා. පියා අසීමිත උරුමයක් දෙන බවත්, මෙම මහා භාරත යුද්ධය මඟින් දිව්‍ය ලෝකයේ දොරටු ඇරෙනවා යන්න ගැනත් ඔවුන්ට ඇහෙනවා. මෙම ඥානය ඉතාම හොඳ බවත් වෙන කිසිම කෙනෙකුට එය ලබා දිය නොහැකි

බවත් ඔවුන් ලියනවා. ඔවුන් මේ සෑම දෙයකටම එකඟ වෙනවා. නමුත් එච්චරයි. ඔවුන්ම කිසිම ඥානයක් නොලබනා අතර නැවතත් නින්දට යනවා. කුම්භකර්ණා ලෙස හඳුන්වන්නේ මෙයයි. ඔබ මෙසේ අපට ලියා භාරදීත් ගෙදර ගොසින් නැවතත් නින්දට යන්න එපා කියා ඔබට කියන්න පුළුවන්. කුම්භකර්ණාගේ පිංතූරය ඉදිරිපිටට ඔවුන්ව රැගෙන ගොස් ඔහු වගේ නිදා ගන්න එපා කියා ඔබට කියන්න පුළුවන්. ඔවුන්ට විස්තර කරන විට ඔබ බොහෝ උපක්‍රමශීලී විය යුතුයි. බාබා කියනවා දරුවනි, ඔබගේ කඩවල් ඉදිරියේ මෙම පින්තූර තියන්න. එවිට එන ඕනෑම කෙනෙකුට මෙය විස්තර කර දෙන්න පුළුවන්. එම ගණුදෙනුවත් කරන්න. ඒ වාගේම මෙම නියම ගණුදෙනුවත් කරන්න. මෙමඟින් බොහෝ දෙනෙකුට යහපතක් කිරීමට ඔබට පුළුවන්. මෙහි පුදුම වීමට ප්‍රශ්නයක් නැහැ. සමහරු කියනවා ඔබ බ්‍රහ්ම කුමරුන් හා කුමරියන් බවට පත්වෙලා කියා. ඔවුන්ට කියන්න ඔහෝ, නමුත් ඔබත් බ්‍රහ්මාගේ බ්‍රහ්ම කුමරුන් හා කුමරියන්. පරමාත්ම පියා දැන් නව ලෝකය නිර්මාණය කරන අතර පැරණි ලෝකය ගින්නක් මත පිළිස්සීමටයි තිබෙන්නේ. ඔබත් බීකේ බවට පත්වනතුරු දිව්‍ය ලෝකය වෙත යන්න බැහැ. කඩවල් වල මේ ආකාරයෙන් සේවය කරන්න. එවිට අසීමිත වූ සේවයක් සිදුවෙයි. ඔබ එකිනෙකා අතර මෙය සාකච්ඡා කරන්න. කඩය කුඩා නම් බිත්තිය උඩ එල්ලන්න පුළුවන්. පුන්‍ය කටයුතු ඇරඹෙන්නේ නිවසිනි. පළමුවෙන්ම ඔබ ඔවුන්ට යහපතක් කළ යුතුයි. පියා කියනවා: දැන් කිසිම මනුෂ්‍යයෙක්ව සිහිකරන්න එපා. ඔබ ඔබගේ උරුමය ලබනා ශිව බාබා සිහිපත් කරන්න. දුප්පත් මිනිස්සු බොහෝ පටලැවිලි තත්ත්වයෙන් සිටින්නේ. ඔබ ඔවුන්ට මෙසේ කිව යුතුමයි: ඔබට දිව්‍යමය ලෝකාධිපත්‍යය ලබා සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන බවට පත්වීමට අවශ්‍ය නම් මෙහි පැමිණ එම තත්ත්වයට පත්වන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. නියම පිරිසිදු බැඳීම පරමාත්ම පියා වෙත තබා ගන්න. ඔහු පමණක් සිහිපත් කරන්න. මනුෂ්‍ය ශරීරයන් වෙත ඔබ තුළ ඇති බැඳීම ඉවත් කරන්න. භාරකරුවෙක් මෙන් හිඳ ඔවුන්ව රැකබලා ගන්න.
2. ඔබ පාප ක්‍රියා පරාජය කළ කෙනෙක් බවට පත්විය යුතුමයි. එමනිසා, තම ඉන්ද්‍රිය මාර්ගයෙන් කිසිම පාප ක්‍රියාවක නොයෙදෙන්නේය යන්න ගැන හොඳ අවධානයකින් සිටින්න.

**වරදානය:** ඔබ අභ්‍යන්තරගතව සහ අලෞකික උසස් ස්ථිතිය තුළ ස්ථාවර වී, උසස් මට්ටමේ අධ්‍යාත්මික ප්‍රීතියක් අත්විඳිත්වා.
තරු සමූහයක් අතර, විශේෂ තරු වල දිදුලන ස්වභාවය දුර සිට බලන විට ඉතා අලංකාර සහ අද්විතීය ලෙස දිස්වේ. ඒ හා සමානව, සාමාන්‍ය ජීවාත්මයන්ගේ එකතුවක් තුළ ඔබ තරු විශේෂ ජීවාත්ම ලෙස දිස්විය යුතුය. ඔබේ සාමාන්‍ය ස්වරූපයෙන් ඔබ සිටියද, ඔබේ අභ්‍යන්තර අවධිය අසාමාන්‍ය සහ අලෞකික විය යුතු අතර, එවිට එම එකතුව තුළ ඔබ දෙවියන්ට අයත් අය ලෙස දිස්වනු ඇත. මේ සඳහා, බාහිර ක්‍රියාකාරකම් වල නිරත වීමට පෙර අභ්‍යන්තර ගතවීමේ පුහුණුව ලබා ගන්න. පළමුව, අධ්‍යාත්මික ප්‍රීතියෙන් යුත් ඔබේ උසස් ස්වභාවය තුළ ස්ථාවර වී, බලවත් සහ ඥාණයෙන් පිරිපුන් වන්න; ඉන්පසු අන් අයටද ඥාණය ලබා දෙන්න. එවිට ඔබට බොහෝ ජීවාත්මයන්ට මේ පිළිබඳ අත්දැකීම් ලබා දීමට හැකි වනු ඇත.

**පාඨය:** ඔබ ළඟ රාවණගේ දේපළ තබාගෙන සිටී නම්, 'දිලාරාම්' (හදවත් වලට සැනසීම ලබා දෙන්නා) හට ඔබේ හදවතේ වැඩ සිටිය නොහැක.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් ඔබගේ දානපති ස්වරූපය හෙළිදරව් කරන්න.**

භාග්‍යය දානපතියාගේ දරුවන් වන ඔබ, සැමටම භාග්‍යය ලබා දෙන 'මාස්ටර් දානපතියන්' වේ. ඔබේ දෘෂ්ටියේ (බැලීමේ) එක් තත්පරයකින් සහ ඔබේ අගනා වචන වලින්, පිපාසිත ජීවාත්මයන්ගේ පිපාසය සංසිඳුවාලීමට

ඔබට හැකියාව ඇත. ඔබේ දොරටුවට පැමිණෙන කිසිදු කුසගින්නෙන් පෙළෙන ජීවාත්මයක් හිස් අතින් ආපසු නොයා යුතුය. සකාර් බාබා මෙය ප්‍රායෝගිකව පෙන්වා දුන්නේය: කිසිදු ජීවාත්මයක් අසතුටින් ආපසු ගියේ නැත. පුද්ගලයෙකු කුමන ආකාරයේ ජීවාත්මයක් වුවද, ඔහු සෑහීමකට පත්ව ආපසු යා යුතුය.